Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : පුරවැසි අධ්‍යාපනය

3 වාරය සතිය - 11

ශ්‍රේණිය : 6

සකස් කිරීම : මාවනැල්ල කලාපය,

<u>පුණරීක්ෂණය</u>

**1-5 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1) පාසලේ ඉතිහාසය යනු,
   1. පාසල ආරම්භ වූ කාලයයි.
   2. පාසල ආරම්භ වූ දා සිට මේ දක්වා කාලයයි.
   3. පාසල ආරම්භ වූ දා සිට පාසල පවතින තුරු කාලයයි.
   4. පාසලේ ඉහළ විභාග ප්‍රතිඵල පෙන්වූ කාලයයි.

2) පාසලක අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් වන්නේ,
   1. කම්කරු 2. ගුරුවරු 3. ලිපිකරු 4. මුරකරු

3) පාසල් කොඩිය ඔසවන විට ප්‍රදර්ශනය කළ යුතු ඉරියව්වක් නොවන්නේ.
   1. පාසල් ගීය ගායනා කිරීම. 2. පාසල් කොඩිය අභිමානයෙන් එසවීම.
   3. පාසල් කොඩියට පිටුපා සිරුවෙන් සිටීම. 4. පාසල් කොඩියට මුහුණලා සිරුවෙන් සිටීම.

4) නිර්මිත පරිසරයට අයත් වනුයේ,
   1. ඇළදොළ 2. උද්‍යාන 3. ගංගා, විල් 4. තුරුලතා

5) මහනගර සභාවක ප්‍රධානියා ලෙස කටයුතු කරන්නේ.
   1. නගරාධිපතිය. 2. සභාපතිය. 3. මහ ඇමතිය. 4. මන්ත්‍රීතුමාය.

- අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණද වැරදි නම් (o) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

6) පාසලක ශිෂ්‍ය ගුරු සංඛ්‍යාව අනුව සංවිධාන ව්‍යුහය වෙනස් විය නොහැක. ( )
7) ඔබේ දුර්වලතාවයන් හේතුවෙන් ඔබට බොහෝ අවාසි සිදුවිය හැක. ( )
8) එක් පාසලක් විවෘත කිරීම සිරගෙයක් වසා දැමීමට හේතුවනු ඇත. ( )
9) අප රටේ කුඩාම පරිපාලන ඒකකය වනුයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයයි. ( )
10) තම බල ප්‍රදේශයේ මංමාවත් ඉදිකිරීම හා නඩත්තු කිරීම ප්‍රාදේශීය සභාවල කාර්යයකි. ( )